# ලන්දේසි යුගයේ ඓතිහාසික ස්ථාන ඇසුරින් එක්දින සංචාරයක් සැලසුම් කිරීම පිළිබඳ විභවතා මහකොළඹ සංචාරක කලාපය ඇසුරින්

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

**පී.පී.ආර්.සංජීවනී ගුණතුංග[1]**
**එස්.පී.දිනේෂා රසාංජලී සේනාරත්න[2]**

**සංක්ෂේපය**

වර්තමානයේ ශ්‍රී ලංකාවට විදේශ විනිමය උපයා දෙන ප්‍රධාන කර්මාන්ත අතර සිව්වන ස්ථානය ලබා ඇත්තේ සංචාරක ව්‍යාපාරයයි. විශේෂයෙන්ම සංවර්ධිත රටවල් මෙන්ම සංවර්ධනය වෙමින් පවතින රටවල් ද සංචාරක ව්‍යාපාරය කෙරෙහි දැඩි උනන්දුවක් දක්වයි. ඒ අනුව විවිධ අරමුණු ඔස්සේ චාරිකා සැලසුම්කරණයට සංචාරකයින්ගේ ආකර්ෂණය වැඩිපුර යොමු වී ඇති බැවින් තුන්වන ලෝකයේ රටවල් චාරිකා සැලසුම්කරණයට යොමු වී ඇති අයුරු දක්නට ඇත. නව විවිධාංගීකරණ සංචාරක ප්‍රභේදයන් ඔස්සේ ලංකාවට පැමිණෙන සංචාරකයින් අතර උරුම සංචාරණයට ප්‍රමුඛතාවයක් ලැබී ඇත. ඒ අනුව ශ්‍රී ලංකාවේ ලන්දේසි යටත්විජිත කාලවකවානුව තුළ ඉදි කරනු ලැබූ ගෘහ නිර්මාණ, ස්මාරක හා අනෙකුත් ඉදිකිරීම් නැරඹීමේ අපේක්ෂාවෙන් නෙදර්ලන්ත ජාතිකයින්ගේ පැමිණීම විශේෂ වේ. මෙතෙක් කාලයක් එම ඓතිහාසික ස්ථානයන් මූලික කරගෙන චාරිකා සැලසුම් වී නොමැත. ඒ අනුව ලන්දේසි යටත්විජිතකරණ උරුමයන් ආශ්‍රිතව එක්දින චාරිකාවක් සැලසුම් කිරීමට අවශ්‍ය විභවතා පිළිබඳව අධ්‍යයනයක යෙදීම මූලික අරමුණ වන අතර සංචාරක උපාංග හඳුනා ගැනීම මෙම අධ්‍යයනයේ සෙසු අරමුණු වේ.

අධ්‍යයන ප්‍රදේශය ලෙස මහකොළඹ සංචාරක කලාපයේ කොළඹ නගරයෙන් පිටත හා මීගමුව ප්‍රදේශයේ ඇති ඓතිහාසික ලන්දේසි ස්ථාන නවයක් තෝරාගත් අතර එම ස්ථාන නැරඹීමට දිනකට එන සංචාරකයින් වෙත ප්‍රශ්නාවලියක් භාවිතා කරමින් සහ නිරීක්ෂණ දත්ත අනුව ප්‍රාථමික දත්ත ලබා ගන්නා ලදී. මීට අමතරව ද්විතීයික දත්ත පොත්, සඟරා හා අත්පත්‍රිකා මඟින් ලබා ගන්නා ලදී. එම ස්ථාන නැරඹීම සඳහා දිනකට පැමිණෙන සංචාරකයින් අතුරින් පෙරවරු 9.00 සිට පස්වරු 3.00 පමණ දක්වා කලය තුළ පැමිණෙන සියලුම සංචාරකයින් ජනසංඛ්‍යා නියදිය ලෙස තෝරා ගනු ලැබුණි. ක්ෂේත්‍ර අධ්‍යයනයෙන් ලබා ගත් දත්ත හා තොරතුරු ගුණාත්මකව හා ප්‍රමාණාත්මකව විස්තරාත්මක හා සංඛ්‍යාන ක්‍රම මඟින් දත්ත විශ්ලේෂණය සිදුකර ඇත.

ශ්‍රී ලංකාවේ සංචාරක වෙළඳපළ තුළ විදේශීය සංචාරකයින්ගේ පැමිණීම බහුල අතර එයින් නෙදර්ලන්ත ජාතිකයින්ගේ පැමිණීම ඉහළ අගයක් ගනී. නෙදර්ලන්ත ජාතිකයින් මෙන්ම අනෙකුත් සංචාරකයින් සංස්කෘතික සංචරණය තුළ උරුම ස්ථාන නැරඹීමට වැඩි කැමැත්තක් දක්වන බව පෙනී යයි. ඒ අනුව එම ස්ථාන සංචාරක ආකර්ෂණීය ගමනාන්ත බවට තවදුරටත් සංවර්ධනය කළ යුතු මට්ටමක පවතින බවත්, සංචාරක උපාංගද තවදුරටත් සංවර්ධනය වියයුතු බවටත් හඳුනාගත හැකිය. එමෙන්ම ලන්දේසි යුගයේ ඓතිහාසික විභවතාවන්ට අනුව එක්දින සංචාරයක් සැලසුම් වියයුතු මට්ටමකට ළඟාවිය හැකි බවත් හඳුනාගත හැකිවිය.

**ප්‍රමුඛ පද: සංචාරක ව්‍යාපාරය, ලන්දේසි යුගයේ ඓතිහාසික සංචාරක විභවතා, එක්දින චාරිකා සැලසුම්කරණය**

1. *භූගෝලවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය, ශ්‍රී ලංකාව*
   rachithrasanjeewani02@gmail.com
2. *කථිකාචාර්ය, භූගෝලවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය, ශ්‍රී ලංකාව*
   dinesha@kln.ac.lk